අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

இலங்கை ஒத்தியல்பு மதிப்பீட்டிற்கான தராதர அங்கீகார சபை

SRI LANKA ACCREDITATION BOARD FOR CONFORMITY ASSESSMENT

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சு

MINISTRY OF TRADE, COMMERCE, FOOD SECURITY AND CO-OPERATIVE DEVELOPMENT

# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை

# ANNUAL REPORT

# 2024

# වාර්ෂික වාර්තාව

# 2024

**අනුකූලතා තක්සේරු පිළිබඳ**

**ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**

**වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය**

**සාමාජිකත්වය,**

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| සභාපතිගේ පණිවිඩය | | ii |
| අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරිගේ සංශිප්තය | | iv |
| 1. | හැඳින්වීම | 1 |
| 1.1. | තත්ත්ව ප්‍රතිපත්තිය, අපක්ෂපාතීත්ව ප්‍රතිපත්තිය, දැක්ම, මෙහෙවර සහ වටිනාකම් | 3 |
| 1.2. | ඉලක්ක, අරමුණු සහ උපාය මාර්ග | 5 |
| 2. | පාලක සභාව | 8 |
| 3. | ව්‍යවස්ථාපිත කමිටු | 10 |
| 3.1. | විගණන ගමිටුව | 10 |
| 4. | මෙහෙයුම් කළමණාකරණය | 11 |
| 4.1. | මානව සම්පත | 11 |
| 4.2. | කාර්යමණ්ඩලය | 11 |
| 5. | කාර්යසාධන විශේෂතා 2024 | 12 |
| 5.1. | ප්‍රතීතන සේවා | 12 |
| 5.2. | පුහුණු වැඩසටහන් | 12 |
| 5.3. | අන්තර්ජාතික කටයතුවලට සහභාගීවීම | 12 |
| 6. | මූල්‍ය තොරතුරු 2024 | 14 |
| 6.1. | මූල්‍ය විශේෂ අවස්ථා | 14 |
| 6.2. | 2024 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 15 |
| 6.3. | 2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය | 17 |
| 6.4. | 2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 18 |
| 6.5. | 2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 19 |
| 6.6. | මූල්‍ය ප්‍රකාශනයේ සටහන් | 24 |

**ඇමුණුම්**

| | | |
|---|---|---|
| ඇමුණුම 01- | සංවිධාන සටහන | 43 |
| ඇමුණුම 02- | ක්‍රියාකාරීත්ව ව්‍යූහය | 44 |
| ඇමුණුම 03- | 2024 දෙසැම්බර් මස 31 වන දිනට සේවක තොරතුරු | 45 |
| ඇමුණුම 04- | සේවක පුහුණුව 2024 | 47 |
| ඇමුණුම 05- | පවත්වන ලද පුහුණු වැඩසටහන් 2024 | 49 |

# සභාපතිගේ පණිවිඩය



අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ (SLAB) පාලක සභාවේ සභාපතිවරයා ලෙස, මහත් වූ අභිමානයෙන් මෙම පණිවිඩය ඉදිරිපත් කරමි. 2024 වසර ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයට සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. එය රටට අඛණ්ඩව වසර විස්සක කැපවූ සේවාවක් සහ විශිෂ්ටත්වයක් ලබා දීම සමරයි. මා 2025 ජනවාරි මාසයේදී සභාපති ධුරයට පත් වුවද, ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතීතන අධිකාරිය ලෙස ප්‍රතීතන මණ්ඩලයේ භූමිකාව ශක්තිමත් කිරීමට 2024 වසර තුළ ලබා ගත් කැපී පෙනෙන ප්‍රගතිය ඉස්මතු කිරීමට ලැබීම මට මහත් සතුටකි.

මෙම වසරේ ප්‍රධානතම ජයග්‍රහණවලින් එකක් වූයේ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කාර්ය ප්‍රවාහ කළමනාකරණ පද්ධතියේ ප්‍රගතිශීලී සංවර්ධනයයි. මෙය ප්‍රතීතන ක්‍රියාවලීන් විධිමත් කිරීම, විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ සියලු පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් උපායමාර්ගික මුලපිරීමකි. 2024 දෙසැම්බර් මාසයේදී, මෙම පද්ධතිය එක් සම්පූර්ණ යෝජනා ක්‍රමයක් සඳහා සජීවීකරණය කරන ලද අතර, ප්‍රතිචාරාත්මක, තත්‍ය කාලීන (real-time) පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සහ ප්‍රතීතන ක්‍රියාකාරකම්වල ඉහළ කාර්යක්ෂමතාවයක් සඳහා අඩිතාලම දමන ලදී. නව රජයේ ඩිජිටල් ප්‍රතිපත්තියට අනුකූලව පුරෝගාමී රාජ්‍ය ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) ස්ථානගත කරමින්, 2025 වන විට මෙම පද්ධතිය ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ සියලුම ප්‍රතීතන යෝජනා ක්‍රම හරහා සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය වනු ඇතැයි මම විශ්වාස කරමි.

2024 පුරාම, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් පරීක්ෂණ, ක්‍රමාංකන, වෛද්‍ය, පරීක්ෂණ සහ හරිතාගාර වායු වලංගු කිරීමේ සහ සත්‍යාපන යෝජනා ක්‍රම හරහා සැලකිය යුතු නව ප්‍රතීතන සංඛ්‍යාවක් සහ විෂය පථ පුළුල් කිරීම් ලබා දෙන ලදී. ජාතික අවශ්‍යතා සහ ජාත්‍යන්තර ප්‍රවණතාවලට ප්‍රතිචාර දක්වමින්, අප මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගනිමින් නව ප්‍රතීතන යෝජනා ක්‍රම ද හඳුන්වා දුන්නෙමු.

මෙම ජයග්‍රහණ සාමූහික ප්‍රයත්නයන් තුළින් සිදුවිය. අපගේ සේවාදායකයන් වන අනුකූලතා තක්සේරු ආයතන වෙත ඔවුන්ගේ අඛණ්ඩ විශ්වාසය වෙනුවෙන් සහ ජාතික තත්ත්ව යටිතල පහසුකම් හරහා අපගේ හවුල්කාර ආයතන වෙත ඔවුන්ගේ සහයෝගය වෙනුවෙන් මාගේ හෘදයාංගම ඇගයීම පුද කරමි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රතීතන තීරණවල විශ්වසනීයත්වය සහ ගෝලීය විශ්වසනීයත්වය සහතික කරන අපගේ තාක්ෂණික කමිටු සාමාජිකයින්ට සහ තක්සේරුකරුවන්ගේ සංචිතයට විශේෂ ස්තූතියක් පිරිනමමි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ නොසැලෙන කැපවීම ද මා අගය කරමි. ඔවුන්ගේ කාර්ය සාධනය, විශේෂඥතාව සහ අනුවර්තනය වීමේ හැකියාව අපගේ සාර්ථකත්වයට පදනම විය.

අවසාන වශයෙන්, නව සභාපතිවරයා ලෙස, අභියෝග ජය ගැනීමට සහ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ඉලක්ක සපුරා ගැනීමට මග පෙන්වූ සහ උපායමාර්ගික දිශාව ලබා දුන් හිටපු සභාපතිවරයාට සහ පාලක සභාවේ සාමාජිකයින්ට මගේ අවංක කෘතඥතාව පුද කරමි. අනුකූලතා තක්සේරුව කෙරෙහි විශ්වාසය තැබීම තුළින් ජාතික තත්ත්ව ප්‍රමිතීන් ඉහළ නැංවීමට, නවෝත්පාදනයන් දිරිමත් කිරීමට සහ ශ්‍රී ලංකාවේ ගෝලීය තරගකාරිත්වය ඉහළ නැංවීමට මෙම උද්යෝගය මත ගොඩනැගීමට අපට හැකි වනු ඇති බව මගේ අවංක විශ්වාසයයි.

**එයාර් වයිස් මාෂල් (විශ්‍රාමික) ප්‍රසන්න රණසිංහ**
සභාපති,
ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ පාලක සභාව.

# අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායකගේ සංශිප්තය



2024 වර්ෂය ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයට (SLAB) තවත් ඵලදායී හා පරිවර්තනීය වසරක් විය. 2023 වසරේදී ආසියා පැසිෆික් ප්‍රතීතන සහයෝගිතාව (APAC) විසින් සිදු කරන ලද එහි ජාත්‍යන්තර සම-සමාලෝචන ඇගයීමේ සාර්ථකත්වය මත පදනම්ව, රටේ අනුකූලතා තක්සේරු යටිතල පහසුකම් ශක්තිමත් කිරීමේ සිය මෙහෙවරෙහි ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ස්ථාවරව කටයුතු කළේය. දැනට නිපුණතා පරීක්ෂණ සපයන්නන් (Proficiency Testing Providers), පුද්ගල සහතික කිරීමේ ආයතන (Personnel Certification Bodies), වලංගුකරන සහ සත්‍යාපන ආයතන (Validation and Verification Bodies), බලශක්ති කළමනාකරණ පද්ධති (Energy Management Systems) සහ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ කළමනාකරණ පද්ධති (Occupational Health and Safety Management Systems) ඇතුළත් APAC අන්‍යොන්‍ය පිළිගැනීමේ විධිවිධානයේ (Mutual Recognition Arrangement - MRA) පුළුල් වූ විෂය පථය, පුළුල් පරාසයක පාර්ශ්වකරුවන්ට අඛණ්ඩව ප්‍රතිලාභ ලබා දුන්නේය. මෙම පිළිගැනීම් මඟින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයට සියලුම ප්‍රතීතනය ලත් සේවාවන් හරහා ජාත්‍යන්තරව පිළිගත් පරීක්ෂණ වාර්තා, සහතික කිරීම්, පරීක්ෂණ සහ සත්‍යාපන වාර්තා නිකුත් කිරීමට හැකියාව ලැබී ඇත.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සිය ප්‍රතීතන සේවාවන් ස්ථානගතව (onsite), දුරස්ථව (remote) සහ දෙමුහුන් ක්‍රමවේදයන් (hybrid modalities) ඔස්සේ අඛණ්ඩව සැපයූ අතර, ප්‍රවේශවීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව සහතික කළේය. 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් නව අනුකූලතා තක්සේරු ආයතන (Conformity Assessment Bodies - CABs) 31 කට සාර්ථකව ප්‍රතීතනය ලබා දුන් අතර, ඒවාට පරීක්ෂණාගාර 11 ක් (Testing Laboratories), ක්‍රමාංකන (Calibration) රසායනාගාර 02 ක්, පද්ධති සහතිකකරණ ආයතන (System Certification Bodies) 05 ක්, නිෂ්පාදන සහතිකකරණ ආයතන (Product Certification Bodies) 03 ක්, වෛද්‍ය රසායනාගාර (Medical Laboratories) 03 ක්, සෝදිසිකිරීමේ ආයතන (Inspection Body) 04 ක්, වලංගුකරන සහ සත්‍යාපන ආයතන 02 ක් සහ නිපුණතා පරීක්ෂණ සපයන්නන් 01 ක් ඇතුළත් විය. තවද, දැනටමත් ප්‍රතීතනය ලබා ඇති අනුකූලතා තක්සේරු ආයතනවලට (CABs) ඔවුන්ගේ හැකියාවන් පුළුල් කිරීමට සහ වර්ධනය වන අදාල අංශවල ඉල්ලීම් සපුරාලීමට ඉඩ සලසමින් විෂය පථ ව්‍යාප්ත කිරීම් (scope extensions) 16 ක් අනුමත කරන ලදී.

පුහුණුව සහ සංවර්ධනය මූලික උපායමාර්ගික අවධානයක් ලෙස පැවතුණි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ප්‍රධාන ප්‍රතීතන යෝජනා ක්‍රම සියල්ල ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් 22 ක් පවත්වන ලද අතර, කර්මාන්ත, නියාමන ආයතන සහ අනුකූලතා තක්සේරු ආයතනවල පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ ලබා දුන්නේය. ධාරිතා ගොඩනැඟීමේ ප්‍රයත්නයන් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ඇගයීම්කරුවන් (assessors), තාක්ෂණික විශේෂඥයින් සහ කාර්ය මණ්ඩලය වෙත ද ව්‍යාප්ත විය. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රතීතන නිලධාරීන් ආසියා පැසිෆික් ප්‍රතීතන සහයෝගිතාව (APAC) විසින් සංවිධානය කරන ලද කලාපීය වැඩසටහන් වලට සහභාගී වූ අතර, තාක්ෂණික දැනුම සහ ජාත්‍යන්තර සහයෝගිතාව ශක්තිමත් කළහ.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය නියාමන ආයතන සමඟ තම සම්බන්ධතාවය තවදුරටත් ගැඹුරු කළේ, තාක්ෂණික රෙගුලාසි ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතීතනය ලත් අනුකූලතා තක්සේරු සේවාවන් අනුගමනය කිරීමට

ඔවුන්ට උපදෙස් ලබා දීමෙන් සහ සහාය වීමෙනි. වසර තුළදී, ප්‍රතීතනය තුළින් නියාමන පද්ධති ශක්තිමත් කිරීම සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලය, කෘෂිකර්ම අමාත්‍යාංශය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික කාබනික පාලන ඒකකය (National Organic Control Unit - NOCU), අපනයන සංවර්ධන මණ්ඩලය, පාරිභෝගික කටයුතු අධිකාරිය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය සමඟ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සමීපව කටයුතු කළේය.

ජාතික ආර්ථික ඉලක්ක සමඟ සමපාතව, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සිය ප්‍රතීතන සේවාවන් ජාත්‍යන්තර අනුකූලතා තක්සේරු ආයතන වෙත ද ව්‍යාප්ත කළ අතර, විදේශ විනිමය උත්පාදනයට සහාය විය. 2024 වර්ෂයේදී, ජාත්‍යන්තර අනුකූලතා තක්සේරු ආයතනවලින් ලැබුණු ආදායම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ මූල්‍ය කළමනාකරණයට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන් අතර, එය රුපියල් මිලියන 72.86 ක් විය.

මූල්‍යමය වශයෙන්, 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ප්‍රබල ලෙස ක්‍රියාත්මක වූ අතර, රුපියල් මිලියන 162.08 ක සම්පූර්ණ ආදායමක් උපයා ගත්තේය, එය 2023 වසරේ රුපියල් මිලියන 157.19 ට වඩා වැඩිවීමකි. ආයතනය 159.96% ක ආදායම්-අධි-පුනරාවර්තන වියදම් අනුපාතයක් අත්කර ගත් අතර, අභ්‍යන්තරව උපයාගත් ආදායම් මඟින් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් දෙකම සාර්ථකව ආවරණය කළේය.

2025 වසරේදී සිය 20 වන සංවත්සරය වෙත ළඟා වෙත්ම, සංවිධානය ජාතික තත්ත්ව යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකා නිෂ්පාදන හා සේවාවන්හි ජාත්‍යන්තර පිළිගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා දශක දෙකක කැපවූ සේවය පිළිබඳ ආඩම්බරයෙන් සිහිපත් කරයි. මෙම සන්ධිස්ථානය, විශ්වාසනීය ප්‍රතීතන සේවාවන් තුළින් විශිෂ්ටත්වය, විශ්වසනීයත්වය සහ ජාතික සංවර්ධනයට සහාය වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ අඛණ්ඩ කැපවීම ඉස්මතු කරයි.

ඉදිරිය දෙස බලන විට, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය නවෝත්පාදනය, ධාරිතා ගොඩනැඟීම සහ ජාත්‍යන්තර සහයෝගිතාව සඳහා කැපවී සිටින අතර, එහි සේවාවන් ඉහළම තත්ත්ව ප්‍රමිතීන් පවත්වාගෙන යන බවට සහතික වෙමින්, ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික අර්ථවත් ලෙස දායක වේ.



**චන්දිතා එදිරිවීර**

වැඩ බලන අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

# 1. හැඳින්වීම

ප්‍රමිති අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) යනු 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතීතන අධිකාරියයි. ප්‍රතීතන මණ්ඩලය වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර, පනතේ විධිවිධාන අනුව පත් කරන ලද සාමාජිකයින් දහතුනකින් (13) සමන්විත සභාවක් මගින් පාලනය වේ. අමාත්‍යවරයා සභාවේ එක් සාමාජිකයෙකු සභාපති ලෙස පත් කරයි. අධ්‍යක්ෂවරයා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර පාලක සභාවේ ලේකම් ලෙස ද කටයුතු කරයි.

ජාතික සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා භාණ්ඩ හා සේවා සැපයීමේ දී අනුකූලතා තක්සේරු පහසුකම් සැලසීම සඳහා ප්‍රතීතන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ අවශ්‍ය ප්‍රතීතන සේවා සැපයීම ප්‍රතීතන මණ්ඩලයේ වගකීම වේ. ප්‍රධාන ප්‍රතීතන සේවාවන් අතරට පරීක්ෂණ/වෛද්‍ය පරීක්ෂණ /ක්‍රමාංකන (Calibration ) රසායනාගාර, පද්ධති සහතිකකරණ /නිෂ්පාදන සහතිකකරණ /පුද්ගල සහතිකකරණ ආයතන, පරීක්ෂණ ආයතන,සත්‍යාපන සහ වලංගුකරන ආයතන ( Validation and Verification Bodies), ප්‍රවීණතා පරීක්ෂණ සපයන්නන් (Proficiency Testing Providers) සහ කර්මාන්තයට, ව්‍යාපාරික ප්‍රජාවට, පාරිභෝගිකයින්ට සහ ශ්‍රී ලංකා රජයට විශේෂිත සේවා සපයන යහපත් රසායනාගාර භාවිතයන් (Good Laboratory Practice) ප්‍රතීතනය කිරීම ඇතුළත් වේ.

ප්‍රතීතන මණ්ඩලය 2005 සැප්තැම්බර් 23 වන දින 2005 අංක 32 දරන ප්‍රතීතන මණ්ඩල පනත සම්මත කිරීමත් සමඟ සිය මෙහෙයුම් ආරම්භ කළේය. ISO/IEC 17011 ( අනුකූලතා තක්සේරු ආයතන ප්‍රතීතනය කිරීම සඳහා වන අවශ්‍යතා සඳහා වන ප්‍රමිතිය) සමඟ අනුකූල වන ආයතනයක් ලෙස සහ ජාත්‍යන්තර රසායනාගාර ප්‍රතීතන සහයෝගිතා අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම (ILAC MRA), ජාත්‍යන්තර ප්‍රතීතන සංසද බහුපාර්ශ්වික ගිවිසුම (IAF MLA) සහ ආසියා පැසිෆික් ප්‍රතීතන සහයෝගිතා අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම (APAC MRA), සඳහා අත්සන් කර ඇති ආයතනයක් ලෙස, ප්‍රතීතන මණ්ඩලය සිය සේවාලාභීන්ට ජාත්‍යන්තරව පිළිගත් ප්‍රතීතන සේවා සපයයි.

## 1.1. තත්ත්ව ප්‍රතිපත්තිය, අපක්ෂපාතීත්ව ප්‍රතිපත්තිය, දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

### තත්ත්ව ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය එහි සේවා ලාභීන්ට උපරිම අවංක භාවයෙන් හා කාර්යක්ෂමතාවයෙන් ප්‍රතීතන සේවා ලබාදීමට බැඳී ඇති සේවා ආයතනයක් විය යුතුය.

ගනුදෙනුකරුවන් හා ඇල්මක් දක්වවන පාර්ශව වල ව්‍යාපාරික පරිසරයේ වෙනස් වන අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ජාත්‍යන්තර ප්‍රමිති හා ප්‍රතිපත්ති වලට අනුව ප්‍රතීතන සේවා ලබා දීමට බැඳී සිටී.

ජාත්‍යන්තර පිළිගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ආයතන සමග ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරනු ලබයි.

අනුකූලතා තක්සේරු හා ප්‍රතීතන සේවා සම්බන්ධව පරිසරයේ ඇති ඉල්ලුම හා අවශ්‍යතාවලට අදාල වැඩිදියුණුකිරීම් සඳහා වන වෙනස් කිරීම් වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය නිරතුරුව එහි ක්‍රියාකාරීත්වය සමාලෝචනයට භාජනය කරනු ලබයි.

## අපක්ෂපාතීත්ව ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රධාන අරමුණු වන්නේ 2005 අංක 32 දරන ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත යටතේ එය ස්ථාපිත කර ඇති කාර්යය සඳහා ශ්‍රී ලංකා රජය විසින් පවරා ඇති රාජකාරි ඉටු කිරීමයි. ප්‍රතීතනයට අදාළ සමස්ත ප්‍රතිපත්ති සහ උපාය මාර්ග වෙනස් කොට සැලකීමකින් තොරව ස්ථාපිත කර ඇත. ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සැකසීමේ ක්‍රියාවලියේදී සියලුම පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සහතික කර වෙනස් කොට සැලකීමකින් තොරව ක්‍රියාත්මක කිරීමේ වගකීම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ පාලක සභාව සතු වේ.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ පිරිස් සහ කමිටු අපක්ෂපාතීත්වයට බාධා පමුණුවන සහ අභ්‍යන්තරයෙන් බාධා පැමිණියහැකි ඕනෑම ගැටුමක් හෙළිදරව් කළ හැකි අනවශ්‍ය වාණිජ, මූල්‍ය සහ වෙනත් පීඩනයකින් තොරව ස්වාධීනව තම ක්‍රියාකාරකම් සහ කාර්යයන් ඉටු කරන බව සහතික කෙරේ. ප්‍රතීතනයට අදාළ තීරණ ගනු ලබන්නේ ඇගයීම් සිදු කරන අයගෙන් වෙනස් වූ එම ක්ෂේත්‍රයේ නිපුණතාවයක් ඇති පුද්ගලයින් හෝ කමිටු විසිනි.

ප්‍රතීතනය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් හැරුණු විට, ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතීතන අධිකාරිය ලෙස ප්‍රතීතනය සඳහා අයදුම් කිරීමට අදහස් කරන ආයතනවලට ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතීතන අධිකාරිය වශයෙන් ගත හැකි තීරණවලට බලපෑ හැකි කරුණු සම්බන්ධයෙන් කිසිදු උපදේශන කටයුත්තක් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය කිසිදු තත්වයක් යටතේ සිදු නොකරනු ඇත.

# දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

## දැක්ම

ජාතික ආර්ථිකයට හා සමාජ සුබසාධනයට දායක වෙමින් ක්‍රියාකාරි හා නවෝත්පාදන ප්‍රතීතන ආයතනයක් ලෙස ජාත්‍යන්තර පිළිගැනීමට ලක් කිරීම"

## මෙහෙවර

දේශීය හා විදේශීය වෙළඳපොළ සඳහා භාණ්ඩ හා සේවා සැපයීමේදී අනුකූලතා තක්සේරු මගින් ජාත්‍යන්තර පිළිගැනීම පහසු කරවන අයුරින් ප්‍රතීතන සේවා ප්‍රවර්ධනය හා සැපයීම අපි කරන්නෙමු"

## වටිනාකම්

- ඍජු හා ඉහළම සදාචාරමය හැසිරීම් රටාවක් තුළ සේවා සැළසීම.
- අඛණ්ඩ අධ්‍යාපනය.
- ඇල්මක් ඇති පාර්ශවයන්ගේ විශ්වාසය තහවුරු වන අයුරින් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම.
- ස්වාධීන හා පක්ෂග්‍රාහී නොවී කටයුතු කිරීම.

## 1.1. ඉළක්ක, අරමුණු සහ උපාය මාර්ග

| | ප්‍රධාන විෂය පථය | ඉලක්ක / අරමුණු | උපායමාර්ග | KPI |
|---|---|---|---|---|
| 1. | විවිධ පාර්ශවකරුවන් අතර ප්‍රතීතනය ප්‍රවර්ධනය කිරීම | 1. ප්‍රතීතනය සහ එහි ප්‍රතිලාභ පිළිබඳව පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම | 1. ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ රැස්වීම්<br>2. පුහුණු වැඩමුළු/වෙබිනාර්<br>3. ජන මාධ්‍ය/වෙබ් අඩවිය/සමාජ මාධ්‍ය භාවිතය තුළින් දැනුවත් කිරීම් | 1. දැනුවත් කරන ලද සංවිධාන/පුද්ගලයින් ගණන<br><br>2. නව ප්‍රතීතන යෝජනා ක්‍රම පිළිබඳව දැනුවත් කරන ලද කර්මාන්ත/ අනුකූලතා තක්සේරු ආයතන සංඛ්‍යාව |
| | | 2. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ජාතික තත්ත්ව යටිතල පහසුකම් ව්‍යුහය තුළ ස්ථානගත කිරීම | 1. යෝජිත ජාතික තත්ත්ව සභාව (NQC) යටතේ SLAB සහ අනෙකුත් NQI ආයතන ස්ථානගත කිරීම සඳහා බලපෑම් ඇති කිරීම | |
| | | 3. SLAB සන්නාමය ප්‍රවර්ධනය කිරීම | 1.SLAB සන්නාමය රට තුළ සහ ඉන් පිටත ප්‍රවර්ධනය කිරීම | 1. සන්නාම ක්‍රියාකාරකම් ගණන |
| 2. | අපක්ෂපාතීත්වය සහතික කරමින් ප්‍රතීතනය පුළුල් කිරීම | 1. පවතින ප්‍රතීතන යෝජනා ක්‍රමවල සේවාදායකයින් සංඛ්‍යාව වැඩි කිරීම | 1. වෙළඳපල බුද්ධිමය ජාලය ශක්තිමත් කිරීම.<br>2. වෙළෙඳපොළ ප්‍රවර්ධනය<br>3. ජාතික/ ජාත්‍යන්තර යෝජනා ක්‍රම හිමිකරුවන් සමග අවබෝධතා ගිවිසුම් ඇති කර ගැනීම. | 1. සේවාලාභීන් සංඛ්‍යාවේ ප්‍රතිශතය වැඩිවීම<br>2. විෂය පථය දිගු කිරීම් ගණන<br>3. හඳුන්වා දුන් නව ප්‍රතීතන යෝජනා ක්‍රම ගණන |
| | | 2. පවතින සේවාදායකයින්ගේ විෂය පථ ගණන වැඩි කිරීම | | |
| | | 3. නව ප්‍රතීතන යෝජනා ක්‍රම හඳුන්වා දීම | | |
| 3. | ප්‍රතීතනය කිරීමේදී නියාමකයින්ගේ ක්‍රියාකාරී මැදිහත්වීම | 1. නියාමකයින් විසින් පිළිගත් අනුකූලතා තක්සේරු සේවා භාවිතය ප්‍රවර්ධනය කිරීම<br><br>2. SLAB ජාත්‍යන්තරව පිළිගත් ප්‍රතීතන සේවා සඳහා ඔවුන්ගේ රෙගුලාසිවල SLAB ප්‍රතීතනය ලත් සේවාවන් සඳහන් කිරීමට නියාමකයින් දිරිමත් කිරීම | 1. නියාමකයින් ඉලක්ක කර ගනිමින් සාදන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>2. SLAB හි තීරණ ගැනීමේ කමිටුවල නියාමකයින් නියෝජනය ලබා ගැනීම.<br>3. නියාමකයින් ඔවුන්ගේ රෙගුලාසිවලට අදාළ විභව ප්‍රතීතන යෝජනා ක්‍රම සමඟ සිතියම්ගත කිරීම සහ පෙළගැස්වීම<br>4.නියාමක සම්බන්ධීකරණ වැඩසටහන් ක්‍රියාත්සක කිරීම. | 1.SLAB සමග කටයුතු කරන නියාමකයින් සංඛ්‍යාව<br>2. පිළිගත් අනුකූලතා තක්සේරු සේවා භාවිතා කිරීමට ඒත්තු ගැන්වූ නියාමකයින් සංඛ්‍යාව<br>3. ප්‍රතීතනය ලත් අනුකූලතා තක්සේරු සේවා සඳහන් කරමින් නිකුත් කරන ලද රෙගුලාසි ගණන |
| 4. | පුද්ගල නිපුණතා සංවර්ධනය සහ හිතකර සේවා පරිසරයක් ඇති කර ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම | 1. ප්රතීතනයේ පුළුල් වන අවශ්‍යතා සපුරාලීම සඳහා ආයතනයේ තාක්ෂණික ධාරිතාව පුළුල් කිරීම | 1. පවතින මානව සම්පත් සංවර්ධනය සහ නව කාර්ය මණ්ඩල බඳවාගැනීමට ක්‍රියා කිරීම.<br><br>2. සුදුසු තාක්ෂණය, නෛතික, පාරිසරික සහ සමාජීය තත්ත්ව වැඩිදියුණු කිරීම් සමඟින් සුහුරු ආයතනයක් බවට පත් කිරීම. | 1. ලබා දුන් නව නිපුණතා ප්‍රමාණය<br>2. නව තාක්ෂණික, නීතිමය සහ සමාජීය වැඩිදියුණු කිරීම් ගණන |
| | | 2. හිතකර සේවා පරිසරයක් සහ කාර්ය මණ්ඩල සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 5. | මූල්‍ය හා පාරිසරික තිරසාරභාවය සහතික කිරීම | 1. SLAB මූල්‍යමය වශයෙන් ස්ථාවර සහ තිරසාර කිරීමට කටයුතු කිරීම. | 1. වත්මන් ප්‍රතීතන යෝජනා ක්‍රමවල සේවාදායක පදනම වැඩි කිරීම<br>2. වෙළෙඳපොළ ඉල්ලුම මත නව ප්‍රතීතන යෝජනා ක්‍රම හඳුන්වා දීම<br>3. පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම<br>4. SLAB හි විෂය පථය තුළ නව ආදායම් උපයන ව්‍යාපාර හඳුනා ගැනීම | 1. වත්මන් ප්‍රතීතන යෝජනා ක්‍රම හරහා ආදායමේ ප්‍රතිශතය වැඩි වීම<br>2. පුහුණු වැඩසටහන් හරහා ආදායමේ ප්‍රතිශතය වැඩි වීම |
| | | 2. වඩාත් යහපත් පාරිසරික භාවිතයන් හඳුන්වා දීම. | 1.බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම | 1. බලශක්ති භාවිතයේ ප්‍රතිශතය අඩු වීම |

| | | | | |
|---|---|---|---|---|
| | | | 2.දේශගුණික හිතකාමී වැඩසටහන්<br>3. ද්‍රව්‍ය භාවිතය කාර්යක්ෂමතාව<br>4. හරිත වාර්තාකරණය ප්‍රවර්ධනය කිරීම. | 2. ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිශතය අඩු වීම<br>3 හරිතාගාර වායු විමෝචනයේ ප්‍රතිශතය අඩු වීම |
| 6. | ප්‍රතීතන ඇගයීම්වල අපක්ෂපාතීත්වය රැකගනිමින් ප්‍රතීතනය සඳහා ජාත්‍යන්තර පිළිගැනීම පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම. | 1.SLAB ප්‍රතීතනය ලබා ගත් අනුකූලතා තක්සේරු ආයතන විසින් නිකුත් කරන ලද අනුකූලතා තක්සේරු වාර්තා සඳහා ජාත්‍යන්තර පිළිගැනීම සහතික කිරීමට කටයුතු කිරීම. | 1. SLAB ප්‍රතීතනය ප්‍රවර්ධනය කිරීමේදී වත්මන් ගැටළු, නව අවශ්‍යතා සහ යෝග්‍ය විසඳුම් හඳුනා ගැනීම සඳහා අදාළ සංවිධාන (EDB, වාණිජ දෙපාර්තමේන්තුව, අපනයනකරුවන්ගේ සංගම්, ප්‍රතීතනය ලත් අනුකූලතා තක්සේරු ආයතන, සාමාජික වෙනත් ප්‍රතීතන ආයතන) සමඟ ජාලගත කිරීම.<br><br>2. ජාත්‍යන්තර ප්‍රතීතන සංවිධානවල අදාළ සංසදවල නියෝජනය, සම ඇගයීම්, පුහුණු කිරීම් සහ SLAB ප්‍රතීතනය ප්‍රවර්ධනය කිරීම.<br><br>3.ප්‍රතීතන මණ්ඩලයේ වත්මන් ජාත්‍යන්තර පිළිගැනීමේ තත්ත්වය වැඩිදියුණු කිරීම. | 1. ප්‍රතීතනය ලත් සහතික/වාර්තා පිළිබඳ ගැටළු සංඛ්‍යාව SLAB මැදිහත්වීමෙන් විසඳා ඇත<br>2. නව බහුපාර්ශ්වික ගිවිසුම් (එම්) හෝ අන්‍යෝන්‍ය පිළිගැනීමේ විධිවිධාන (එස්) සඳහා අයදුම්පත්<br>3. නව බහුපාර්ශ්වික ගිවිසුම් (MLA) හෝ අන්‍යෝන්‍ය පිළිගැනීමේ විධිවිධාන (MRA) පිළිගැනීම්.<br>4. සහභාගී වූ රැස්වීම්/සංසද ගණන |
| | | 2. කලාපීය සහ ගෝලීය මට්ටමේ ප්‍රතීතන වර්ධනයන් සඳහා දායක වීම | 1 APAC සම ඇගයීම්වලට සහභාගී වීම.<br>2. රැස්වීම්/කමිටුවලට සහභාගී වීම<br>3. පුහුණු වැඩසටහන් වල සම්පත් දායකයකන් ලෙස සහභාගී වීම. | 1. සහභාගී වූ සම ඇගයීම්, රැස්වීම්, කමිටු සංඛ්‍යාව |

## 1.3. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කාර්යයන්

- ජාත්‍යන්තර සහ ජාතික ප්‍රමිතීන්ට අනුකූලව, අනුකූලතා තක්සේරු ආයතන සඳහා ප්‍රතීතනය ලබා දීම.
  - පරීක්ෂණාගාර (ISO/IEC 17025)
  - ක්‍රමාංකන රසායනාගාර(ISO/IEC 17025)
  - වෛද්‍ය රසායනාගාර (ISO 15189)
  - පද්ධති සඳහා සහතික කිරීමේ ආයතන (ISO/IEC 17021)
  - නිෂ්පාදන සඳහා සහතික කිරීමේ ආයතන (ISO/IEC 17065)
  - පුද්ගලයන් සඳහා සහතික කිරීමේ ආයතන (ISO/IEC 17024)
  - වලංගු කිරීමේ හා සත්‍යාපන ආයතන (ISO/IEC 17029)
  - පරීක්ෂණ ආයතන (ISO/IEC 17020)
  - ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහන් (ISO/IEC 17043); හා
  - රසායනාගාර යහපාලන පරිචයන් සඳහා පුහුණුව (GLP)

- ජාතික තත්ත්ව ප්‍රතිපත්තියේ දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රතීතන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.

- අදාළ පාර්ශවකරුවන් සඳහා තක්සේරු පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සම්මන්ත්‍රණ පැවැත්වීම

- අනුකූලතා තක්සේරුව සම්බන්ධයෙන් සහයෝගීතාවය සහ සම්බන්ධතා සඳහා ජාතික සංසදය ලෙස කටයුතු කිරීම.

- තාක්ෂණික දැනුම ප්‍රවර්ධනය කිරීම සහ බෙදා හැරීම තුළින් ප්‍රතීතන පරිචයන් සහ තක්සේරු ක්‍රියා පටිපාටිවල නිපුණතාවය ඇති කිරීම.

- ප්‍රතීතනය සඳහා ජාතික පද්ධති සඳහා සහාය වීම සහ සංවර්ධනය කිරීම.

- සමාන විදේශීය හා ජාත්‍යන්තර ආයතන සමඟ අන්‍යෝන්‍ය පිළිගැනීම පිළිබඳ ගිවිසුම් අත්සන් කිරීම.

- ප්‍රතීතනය ලබා දීම, විෂය පථය දිගු කිරීම, විෂය පථය අඩු කිරීම, ප්‍රතීතනය අත්හිටුවීම හෝ ඉවත් කර ගැනීම සඳහා අනුකූලතා සහ සාක්ෂි තක්සේරු කිරීම් සංවිධානය කිරීම, කළමනාකරණය කිරීම සහ පැවැත්වීම.

# 2. පාලක සභාව

2005 අංක 32 දරන අනුකූලතා තකස්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ විධිවිධාන යටතේ ගරු අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් දහතුන් (13) දෙනෙකුගෙන් සමන්විත පාලක මණ්ඩලය වෙත මණ්ඩලයේ බලතල හා කාර්යයන් පැවරී ඇත. අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා පාලක මණ්ඩලය සෑම මසකම රැස්වේ.

2024 දෙසැම්බර් 31 දිනට පාලක මණ්ඩලයේ සංයුතිය පහත පරිදි විය.

**ආචාර්ය සම්පත් වාහල** - සභාපති

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,

කළමනාකරණ අධ්‍යයන පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.

**ජේ. කේ. එන්. සමන්මලී මහත්මිය** - සාමාජික

අධ්‍යක්ෂ, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මුදල්,

ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය. භාණ්ඩාගාර නියෝජිත

**සිද්ධිකා සේනාරත්න මහත්මිය** - සාමාජික

අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය.

**එස්. එන්. අකුරන්තිලක මහතා** - සාමාජික

අධ්‍යක්ෂ, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව.

**එම්. පී. එන්. එම්. වික්‍රමසිංහ මහතා** - සාමාජික

අතිරේක ලේකම් තාක්ෂණ අමාත්‍යාංශය.

**අයිවර් ලෙනිස් කුලතුංග රත්නායක මහතා** - සාමාජික

අමාත්‍යවරයා විසින් පත් කරන ලදී

**මහාචාර්ය එම්. පී. පී. ධර්මදාස** - සාමාජික

පීඨාධිපති, කළමනාකරණ හා මූල්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.

**වී.පී.කේ. පිලපිටිය මහත්මිය** - සාමාජික

අතිරේක ලේකම්, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය.

**එස්. ඒ. මහින්ද ලාල් ගුණතිලක මහතා** - සාමාජික

අතිරේක ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය.

**වත්සලා ප්‍රියදර්ශනී මහත්මිය** - සාමාජික

අතිරේක ලේකම් (පාලන) - i සෞඛ්‍ය අමාත්‍යාංශය

**ජී. ජී. වී. ශාමලී මහත්මිය** - සාමාජික

අධ්‍යක්ෂ (කෘෂිකර්ම සංවර්ධන) කෘෂිකර්ම අමාත්‍යාංශය

**මහාචාර්ය අතුල පෙරේරා** - සාමාජික

ජාතික විද්‍යා ඇකඩමිය (NAS)

# 3. ව්‍යවස්ථාපිත කමිටු

## 3.1. විගණන කමිටු

විගණන කමිටුව පාලක මණ්ඩලයේ විධායක නොවන සාමාජිකයින් 3 දෙනෙකුගෙන්, විගණකාධිපති නියෝජිතයෙකුගෙන් සහ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (කමිටු ලේකම්) යන අයගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය හා පරිපාලන) සහ අභ්‍යන්තර විගණක ආරාධිතයෙකු සහ සම්බන්ධීකාරක ලෙස කටයුතු කරයි. පාලක මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිතයා කමිටුවේ සභාපති වේ.

කමිටුවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ කාර්යක්ෂම අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාම සහ බාහිර මූල්‍ය වාර්තාකරණ බැඳීම් ඉටු කිරීම සඳහා පාලක මණ්ඩලයට සහාය වීමයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ස්වාධීන අභ්‍යන්තර විගණන කාර්යයක් පවතින අතර එය විගණන කමිටුවට වාර්තා කරයි. බාහිර විගණන කාර්යයන්හි සඵලතාවය අධීක්ෂණය කිරීම සහ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ද කමිටුව වගකිව යුතු වේ.

කමිටුව වසර තුළ රැස්වීම් 04ක් පවත්වා ඇති අතර මණ්ඩලයේ අභ්‍යන්තර විගණක සහ විගණකාධිපති විසින් ඉදිරිපත් කරන ලද සියලුම වාර්තා සමාලෝචනය කර ඇත. සියලුම විගණන කමිටු රැස්වීම්වල වාර්තා පාලක මණ්ඩල රැස්වීම්වලදී ඉදිරිපත් කෙරේ.

| | | |
|---|---|---|
| ජේ.කේ.එන්. සමන්මලී මහත්මිය | සභාපති/පාලක මණ්ඩල සාමාජික | භාණ්ඩාගාර නියෝජිත |
| පී.එම්.පී.එන්.එම්. වික්‍රමසිංහ මයා | සාමාජික/ පාලක මණ්ඩල සාමාජික | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය නියෝජනය |
| වී.පී.කේ. පිලපිටිය මහත්මිය | සාමාජික/පාලක මණ්ඩල සාමාජික | වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය |
| සුරංගි රාජපක්ෂ මිය | නිරීක්ෂක | ප්‍රධාන අභ්‍යන්තර විගණක, වෙළඳ,වාණිජ අමාත්‍යාංශය |
| සඳුනිමා පෙරේරා මහත්මිය | නිරීක්ෂක | විගණකාධිපති නියෝජනය |
| ආර්.ආර්.කේ. නුගපිටිය මහතා | නිරීක්ෂක | අමාත්‍යාංශ ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය | ලේකම් | අධ්‍යක්ෂ/ප්‍ර.වි. නිලධාරී, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය |
| හර්ෂා චන්ද්‍රසිරි මහත්මිය | ආරාධිත | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය හා පරිපාලන), ප්‍රතීතන මණ්ඩලය |
| ටී. වනිගසුන්දර මහත්මිය | සම්බන්ධීකාරක | අභ්‍යන්තර විගණක, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය |

# 4. මෙහෙයුම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කළමනාකරණ කාර්යයන් අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී තනතුර වෙත පැවරී ඇති අතර, ඇමුණුම 01 හි දැක්වෙන සංවිධාන ව්‍යුහයෙහි දැක්වෙන පරිදි තාක්ෂණික, මූල්‍ය සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව මණ්ඩලයේ සියලු විධායක කාර්යයන් ඉටු කිරීමේ වගකීම අධ්‍යක්ෂවරයා සතු වේ.

## 4.1. මානව සම්පත්

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ මානව සම්පත සමන්විත වන්නේ කුඩා අභ්‍යන්තර කාර්ය මණ්ඩලයකින් සහ විශ්වවිද්‍යාල හා විවිධ වෘත්තීය ආයතනවලින් ලබාගත් විශාල තක්සේරුකරුවන්ගේ සමූහයකිනි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය අනුකූලතා ඇගයීම් ආයතනවල නිපුණතාව තහවුරු කිරීම සමඟ කටයුතු කරයි. ආයතනය ආරම්භයේ සිට කාර්ය මණ්ඩල පිරිවැටුම පෙර වසරවල ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කාර්යයන් කෙරෙහි දැඩි ලෙස බලපෑ නමුත්, කාර්ය මණ්ඩල සම්පූර්ණ කිරීමත් සමඟ, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විදේශීය ප්‍රතීතන ආයතන සමඟ සමානව එහි ප්‍රතීතන පද්ධති පවත්වාගෙන යාමට සමත් විය. සාමාන්‍යයෙන්, නව නිලධාරියෙකුට ස්වාධීනව කටයුතු කිරීම සඳහා පත් කිරීමට පෙර අදාළ ක්ෂේත්‍රයක නිපුණතාවය ලබා ගැනීමට අවම වශයෙන් වසර තුනක් අවශ්‍ය වේ. ආයතනික කාර්ය මණ්ඩලය සඳහා ලබා දෙන පුහුණුව පිළිබඳ විස්තර ඇමුණුම 04 හි සපයා ඇත.

## 4.2. කාර්ය මණ්ඩලය



# 5. කාර්ය සාධන විශේෂතා 2024

2024 වර්ෂය වන විට ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මෙහෙයුම් කටයුතු ආරම්භ කර වසර 19 ක් සම්පූර්ණ කර තිබුණි. පරීක්ෂණ සහ ක්‍රමාංකන රසායනාගාරල වෛද්‍ය රසායනාගාරල සහතික කිරීමේ ආයතන සහ පරීක්ෂණ ආයතන සඳහා අදාළ ජාත්‍යන්තර ප්‍රමිති මත පදනම්ව ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සිය සේවාවන් අඛණ්ඩව සැපයීය. මෙම ප්‍රතීතන යෝජනා ක්‍රමල ප්‍රතීතන ආයතන සඳහා අදාළ වන ජාත්‍යන්තර මූලධර්ම සහ ISO/IEC 17011 ප්‍රමිතීන්ට අනුකූලව කළමනාකරණය කර මෙහෙයවන ලදී.

## 5.1. ප්‍රතීතන සේවා

2024 වර්ෂයේදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් පහත දක්වා ඇති පරිදි අනුකූලතා තක්සේරු කිරීමේ ආයතන සඳහා ප්‍රතීතනය ලබා දෙන ලදී.

| ප්‍රතීතන යෝජනා ක්‍රමය | ප්‍රගතිය |
|---|---|
| පරීක්ෂණ සහ ක්‍රමාංකන රසායනාගාර | නව -11, විෂය පථය දිගු කිරීම් -08 |
| | නව -02, විෂය පථය දිගු කිරීම් -08 |
| පද්ධති සහතික කිරීමේ ආයතන | නව -05 |
| සහතික කිරීමේ ආයතන - නිෂ්පාදන | නව -03 |
| සෝදිසි කිරීමේ ආයතන | නව -04 |
| වෛද්‍ය පරීක්ෂණාගාර | නව -03 |
| වලංගු කිරීමේ හා සත්‍යාපනය කිරීමේ ආයතන | නව -02 |
| නිපුනතා පරීක්ෂාකිරීමේ ආයතන | නව -01 |

## 5.2. පුහුණු වැඩසටහන්

2024 වසර තුළදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ප්‍රතීතන ක්‍රමවේද බොහොමයක් ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් 22ක් පවත්වා ඇති අතර, විවිධ අනුකූලතා තක්සේරු ආයතන සහ කර්මාන්ත වලින් සහභාගීවූවන් 529කට පුහුණුව ලබා දී ඇත. 2024 වසර තුළ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් පවත්වන ලද වැඩසටහන් වල විස්තර උපලේඛන 05 හි දක්වා ඇත.

### 5.3. ජාත්‍යන්තර වැඩසටහන්වල සහභාගීත්වය

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රතීතන යෝජනා ක්‍රම සඳහා ජාත්‍යන්තර පිළිගැනීම පවත්වාගෙන යාම පිණිස, සාමාජික ආයතනයක් ලෙස ප්‍රතීතන මණ්ඩලය සතු වගකීම් යටතේ, ජාත්‍යන්තර ප්‍රතීතන ආයතනවල මධ්‍ය-වාර හා වාර්ෂික රැස්වීම්වල තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ට සක්‍රීයව සහභාගී වීම සහ දායක වීම අත්‍යවශ්‍ය වේ.

ඒ අනුව, 2024 වර්ෂයේදී, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ILAC–IAF මධ්‍ය-වාර රැස්වීම් (අන්තර්ජාලය ඔස්සේ පැවැත්වුණි) සහ ILAC සහ IAF හි වාර්ෂික ඒකාබද්ධ රැස්වීම් යන දෙකටම සහභාගී විය.

- අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරිනී චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතීතන) චන්දිතා එදිරිවීර මහත්මිය සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතීතන) මනීෂා වික්‍රමසිංහ මහත්මිය, 2024 අප්‍රේල් මාසයේදී අන්තර්ජාලය ඔස්සේ පැවති ILAC–IAF මධ්‍ය-වාර රැස්වීම් සඳහා සහභාගී වූහ.

- අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරිනී (රාජකාරි ආවරණය) චන්දිතා එදිරිවීර මහත්මිය, 2024 සැප්තැම්බර් මාසයේදී පැවති ILAC සහ IAF හි ඒකාබද්ධ වාර්ෂික රැස්වීම් සඳහා සහභාගී විය.

නිල නියෝජිත සහ විකල්ප නියෝජිත ලෙස, පිළිවෙළින් චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය සහ චන්දිතා එදිරිවීර මහත්මිය, ILAC සහ IAF ඡන්ද විමසීම් ක්‍රියාවලීන්හිදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය නියෝජනය කළහ.

මෙම දායකත්වයන්ට අමතරව, සම-සමාලෝචන ඇගයීම් සඳහා සහභාගී වීමට APAC විසින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ නිලධාරීන් කිහිප දෙනෙකු පත් කරන ලදී:

- චන්දිතා එදිරිවීර මහත්මිය සහ මනීෂා වික්‍රමසිංහ මෙනවිය ප්‍රමුඛ සම-සමාලෝචකවරුන් ලෙස කටයුතු කළහ.
- මිරීලා ගුණසේකර මෙනවිය සම-සමාලෝචකවරියක් ලෙස සේවය කළාය.
- නතාෂා ජයමන්න මහත්මිය සහ පුණ්‍යා ලියනගේ මහත්මිය තාවකාලික සම-සමාලෝචකවරුන් ලෙස සේවය කළහ.

මෙම සහභාගීත්වයන් මඟින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ සාමාජිකත්ව වගකීම් ඉටු කරනවා පමණක් නොව, ගෝලීය ප්‍රතීතන ප්‍රජාව තුළ එහි සක්‍රීය නියැලීම ද ශක්තිමත් කරයි.

# 6. මූල්‍ය තොරතුරු 2024

## 6.1 විශේෂ මූල්‍ය අවස්ථා

වාර්ෂික පුනරාවර්තන වියදම් සඳහා වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 93.21 කි. පුනරාවර්තන හෝ ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාර දායකත්වයක් නොතිබුණි. භාණ්ඩාගාරයේ රුපියල් මිලියන 21.18 ක දායකත්වය ඇතුළුව සත්‍ය පුනරාවර්තන වියදම රුපියල් මිලියන 101.32 කි.

සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ප්‍රධාන වශයෙන් ප්‍රතීතන සේවා සහ පුහුණු වැඩසටහන් මඟින් එහි ක්‍රියාකාරකම් වලින් රුපියල් මිලියන 162.08 ක් උපයා ඇත. පුනරාවර්තන වියදම් ඉක්මවා ආදායම 159.96% කි.

මුළු ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 3.44 ක් වූ අතර සියලු වියදම් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ආදායම් මඟින් දරන ලදී.

| වසර | පුනරාවර්තන වියදම් (රු. මිලියන) | | | | ප්‍රාග්ධන වියදම් (රු. මිලියන) | | |
|---|---|---|---|---|---|---|---|
| | අයවැය වියදම් | සත්‍ය වියදම් | භාණ්ඩාගාර ප්‍රදාන | ඉපයීම් | අයවැය වියදම් | සත්‍ය වියදම් | භාණ්ඩාගාර ප්‍රදාන |
| 2007 | 14.70 | 11.50 | 8.23 | 2.83 | 1.50 | 1.40 | 1.50 |
| 2008 | 17.29 | 13.98 | 10.56 | 3.27 | 2.74 | 0.41 | 0.50 |
| 2009 | 19.60 | 15.01 | 11.47 | 3.32 | 2.33 | 0.44 | 0.66 |
| 2010 | 21.81 | 15.51 | 8.91 | 5.30 | 3.57 | 0.63 | 0.50 |
| 2011 | 23.30 | 21.33 | 13.28 | 8.12 | 3.08 | 0.63 | 0.80 |
| 2012 | 28.18 | 29.29 | 15.50 | 12.9 | 1.82 | 1.75 | 1.37 |
| 2013 | 33.00 | 36.61 | 14.80 | 18.08 | 2.00 | 1.51 | 1.50 |
| 2014 | 38.00 | 42.85 | 16.09 | 27.58 | 2.00 | 1.71 | 1.73 |
| 2015 | 64.50 | 63.14 | 12.20 | 55.24 | 3.00 | 1.64 | 1.25 |
| 2016 | 56.00 | 49.43 | 15.70 | 31.74 | 5.20 | 4.67 | 2.00 |
| 2017 | 60.5 | 57.91 | 16.16 | 36.03 | 2.00 | 2.05 | 0.91 |
| 2018 | 66.0 | 59.79 | 17.06 | 45.23 | 4.25 | 3.64 | - |
| 2019 | 71.8 | 66.67 | 19.49 | 47.43 | 6.92 | 2.43 | 1.4 |
| 2020 | 72.70 | 51.50 | 19.64 | 37.08 | 3.69 | 1.97 | 0.5 |
| 2021 | 75.87 | 54.31 | 17.68 | 49.35 | 3.80 | 2.62 | - |
| 2022 | 79.95 | 60.29 | 19.35 | 66.96 | 6.65 | 0.17 | - |
| 2023 | 87.61 | 81.12 | - | 157.19 | 9.00 | 1.96 | - |
| 2024 | 93.21 | 101.32 | - | 162.08 | 3.52 | 3.44 | - |

**6.2. 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**

අනුකූලතා තක්සේරුව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය
2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

| | Notes | Actual 2024 | Actual 2023 |
|---|---|---|---|
| **වත්කම්** | | **Rs.** | **Rs.** |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමාන | 19 | 67,485,583.88 | 129,192,881.62 |
| දේශීය මිලදී ගැනීම් අත්තිකාරම් | 27 | - | 949,267.50 |
| ලැබිය යුතු දේ | 11 | 67,353,597.67 | 13,556,235.22 |
| මුද්දර | | 15,000.00 | 15,000.00 |
| ලිපි ද්‍රව්‍ය තොගය | | 261,757.70 | 330,426.55 |
| පෙර ගෙවීම් | 17 | 651,616.16 | 492,780.01 |
| වැට් බදු පාලනය | | 175,959.01 | 175,959.01 |
| ආපදා ණය | 16 | 1,177,000.00 | 1,135,800.00 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු සහ අත්තිකාරම් | 10 | 2,075,700.00 | 2,075,700.00 |
| | | 139,196,214.42 | 147,924,049.91 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල සහ උපකරණ | 29 | 5,306,962.54 | 3,775,612.06 |
| ආපදා ණය | 16 | 1,614,396.12 | 1,133,896.12 |
| **අස්පෘශ්‍ය වත්කම්** | | | |
| බුද්ධිමය දේපල සහ සංවර්ධන ක්‍රියාකාරකම් | 18 | 952,115.62 | 287,634.25 |
| පාරිතෝෂික සඳහා ආයෝජනය | 1.14 | 4,928,197.56 | 4,567,866.73 |
| අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන්කිරීම | 28 | 100,458,855.75 | 27,907,717.94 |
| | | 113,260,527.59 | 37,672,727.10 |
| **මුළු වත්කම්** | | **252,456,742.01** | **185,596,777.01** |
| **වගකීම්** | | | |
| ජංගම වගකීම් | | | |
| ණය හිමියන් | 22 | 292,093.00 | 351,093.00 |
| උපචිත සහ අනෙකුත් ගෙවිය යුතු දේ | 14 | 63,979,982.98 | 6,464,009.39 |
| වාර්ෂික නිවාඩු සඳහා ප්‍රතිපාදන | | 770,503.60 | 754,024.93 |
| අත්තිකාරම් ලැබීම් | 24 | 932,500.00 | 932,500.00 |
| | | **65,975,079.58** | **8,501,627.32** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | 23 | 6,629,105.00 | 5,108,510.00 |
| මුළු වගකීම් | | **72,604,184.58** | **13,610,137.32** |

| | | | |
|---|---|---|---|
| **ශුද්ධ වත්කම්** | | **179,852,557.43** | **171,986,639.69** |
| **<u>ශුද්ධ වත්කම් / කොටස්</u>** | | | |
| සමුච්චිත අරමුදල | **12** | 169,634,336.15 | 161,768,418.41 |
| විලම්භිත ආදායම්- රජයේ ප්‍රදානයන් | **13** | 7,793,973.28 | 7,793,973.28 |
| අනෙකුත් ප්‍රදානයන් | **20** | 2,424,248.00 | 2,424,248.00 |
| **ශුද්ධ වත්කම් / කොටස්** | | **179,852,557.43** | **171,986,639.69** |

පිටු 5 සිට 8 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 9 සිට 14 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා සභා සාමාජිකයන් වගකිව යුතුය. මෙම මූල්‍ය වාර්තාවට මණ්ඩලයේ පාලක සභාව වෙනුවෙන් අත්සන් කර ඇත.

............................................
එස් ඒස් ගුණසේකර
සභා සාමාජික
මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින්

.................................
චන්දිතා එදිරිවීර
අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී-වැඩබලන
ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

............................................
සී එච් ගමගේ
සභා සාමාජික

.....................................
කේ.එච්.එන් චන්ද්‍රසිරි
සහකාර අධ්‍යක්ෂ (මුදල් හා පරිපාලන)
ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

**6.3. 2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය**

**අනුකූලතා තක්සේරුව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**
**2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**
**මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | සත්‍ය 2024 Rs. | සත්‍ය 2023 Rs. | අයවැය-2024 Rs. |
|---|---|---|---|---|
| ආදායම | 1 | **171,947,201.89** | **166,499,857.61** | **147,788,600.00** |
| **මුළු ආදායම** | | **171,947,201.89** | **166,499,857.61** | **147,788,600.00** |
| **පරිපාලන සහ ආයතන වියදම්** | | | | |
| පුද්ගල පඩි නඩි | 2 | 36,768,161.66 | 28,721,403.03 | 38,061,797.60 |
| ගිවිසුම්ගත සේවා | 6 | 35,482,359.65 | 32,370,549.94 | 37,555,000.00 |
| සැපයුම් | 4 | 871,956.77 | 997,934.93 | 1,000,000.00 |
| දායකත්ව සහ සාමාජික ගාස්තු | 7 | 3,652,854.90 | 3,918,594.83 | 4,300,000.00 |
| ගමන් වියදම් | 3 | 5,071,451.19 | 2,753,874.57 | 7,200,000.00 |
| නඩත්තු වියදම් | 5 | 4,418,754.94 | 5,656,107.32 | 4,600,000.00 |
| වෙනත් | 8 | 1,962,080.12 | 3,295,152.98 | 420,000.00 |
| මූල්‍ය පිරිවැය සහ වෙනත් | 9 | 13,088,712.00 | 3,410,733.99 | 75,000.00 |
| අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන්කිරීම් | | - | - | 0.00 |
| **මුළු වියදම** | | **101,316,331.23** | **81,124,351.59** | **93,211,797.60** |
| **භාණ්ඩාගාර දායකත්වය** | | **(21,189,261.20)** | **0.00** | |
| **වියදමට වැඩි වූ අතිරික්තය** | | **49,441,609.46** | **85,375,506.02** | **-** |

**6.4.2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය**

**<u>අනුකූලතා තක්සේරුව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය</u>**
**<u>2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා</u>**
**<u>ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය</u>**

| | විලම්භීත ආදායම (රු.) | වෙනත් දීමනා (රු.) | සමුච්චිත අරමුදල (රු.) | සමස්ත (රු.) |
|---|---|---|---|---|
| **2023 ජනවාරි 1 වන දිනට ශේෂය** | (9,908,592.21) | 814,600.00 | 38,170,828.30 | 85,594,361.01 |
| **එකතුව** | **(9,908,592.21)** | **814,600.00** | **38,170,828.30** | **85,594,361.01** |
| **2023 ජනවාරි 1 වන දිනට ශේෂය** | - | - | - | - |
| වියදම් ගැලපීම | - | - | - | - |
| ලැබිය යුතු ගැලපීම | | | | (169,000.00) |
| ගැලපීම- ස්ථාවර තැන්පතු පොලී | | | | (1,652.08) |
| ගැලපීම- ස්ථාවර තැන්පතු පොලී ලැබිය යුතු | | | | 1,006,762.93 |
| ගැලපීම- තාක්ෂණික උපකරණ සමුච්චිත ක්ෂය | | | | 180,661.81 |
| වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය). | | | 85,375,506.02 | 85,375,506.02 |
| වර්ෂය **2023 දෙසැම්බර් 31** දිනට | **(9,908,592.21)** | **1,814,600.00** | **223,546,334.32** | **171,986,639.69** |
| **2024 ජනවාරි 1 වන දිනට ශේෂය** | (9,908,592.21) | 1,814,600.00 | 223,546,334.32 | 171,986,639.69 |
| භාණ්ඩාගාර දායකත්ව ගැලපීම | | | (22,336,181.33) | (22,336,181.33) |
| වැඩිපුර ලැබූ මුදල ගැලපීම | | | (19,121,474.70) | (19,121,474.70) |
| සමුච්චිත ක්ෂය ගැලපීම | - | - | (10,369.36) | (10,369.36) |
| Control Union Netherlands අදායම ගැලපීම | | | | - |
| ලැබිය යුතු ආදායම ගැලපීම | | | (243,666.33) | (243,666.33) |
| ගැලපීම- වත්කම් වියදමට ගැනීම | - | | 136,000.00 | 136,000.00 |
| වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය). | | | 49,441,609.46 | 49,441,609.46 |
| ශේෂය 2024 දෙසැම්බර් 31 දිනට | **(9,908,592.21)** | **1,814,600.00** | **231,412,252.06** | **179,852,557.43** |

**6.5. 2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**<u>2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u>**

| විස්තර | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| **වසර සඳහා අතිරික්තය** | 49,441,609.46 | 85,375,506.02 |
| <u>**ගැලපීම්**</u>; | | |
| ස්ථාවර වත්කම්වල ක්ෂයවීම් | 1,899,147.69 | 1,931,445.53 |
| පාරිතෝෂිත වෙන්කිරීම | 1,671,087.50 | 183,972.50 |
| ක්ෂය ගැලපීම | 10,369.36 | - |
| වත්කම් හුවමාරුවේ නැතිවූ ශුද්ධ අගය | - | 45,582.01 |
| වත්කම් විකිණීමෙන් ලාභය / පාඩුව | - | (1,354,854.90) |
| ආපදා ණය ගැලපීම | - | - |
| තාක්ෂණික උපකරණයට ගැලපීම සමුච්චිත ක්ෂයවීම් | - | 180,661.81 |
| වියදම් සඳහා ගැලපීම | (2,684,971.93) | - |
| ක්ෂය ගැලපීම | - | - |
| සමුච්චිත අරමුදලට ගැලපීම් | (38,890,719.79) | (169,000.00) |
| වත්කම් හුවමාරු ගැලපීම් | - | 1,005,110.85 |
| ප්‍රවීණතා පරීක්ෂණ ක්‍රමක්ෂ කිරීම | 5,518.63 | 11,037.25 |
| NBT ශේෂය කපා හැරීම | | 32,557.83 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය** | **11,452,040.92** | **87,242,018.90** |
| <u>**කාරක ප්‍රාග්ධන වෙනස්කම්**</u> | | |
| <u>උත්සව අත්තිකාරම් </u>අඩු කිරීම / (වැඩිවීම). | - | 2,500.00 |
| කලින් ලැබුණු අඩු කිරීම / (වැඩිවීම). | - | (13,726,331.82) |
| පෙරගෙවුම් වල අඩු කිරීම /(වැඩිවීම). | (158,836.15) | 1,070,998.73 |
| ලැබිය යුතු මුදල් අඩු කිරීම /(වැඩිවීම). | (53,797,362.45) | 2,516,946.77 |
| ණය හිමියන්ගේ වැඩි වීම/(අඩුවීම). | (59,000.00) | (54,524.10) |

| | | |
|---|---|---|
| මිලදී ගැනීම් අත්තිකාරම් අඩුකිරීම/වැඩිවීම | 949,267.50 | (914,267.50) |
| වාර්ෂික නිවාඩු ප්‍රතිපාදන වැඩි කිරීම/(අඩු වීම). | 16,478.67 | (96,700.33) |
| උපචිත වියදම් වැඩි කිරීම/(අඩු වීම). | 57,515,973.59 | 3,990,197.52 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු වැඩි කිරීම/(අඩු වීම). | - | 1,444,800.00 |
| තොගයේ සහ අනෙකුත් අයිතමවල වැඩි කිරීම/(අඩු වීම). | 68,668.85 | 35,185.50 |
| ගෙවිය යුතු අනෙකුත් වැඩිකිරීම/(අඩුවීම). | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | **15,987,230.93** | **81,510,823.67** |
| <u>**ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා ඒම**</u> | | |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | (4,110,867.53) | (1,965,682.75) |
| වර්ෂය තුළ ආපදා ණය ප්‍රදානය කරන්න | (2,000,000.00) | (1,500,000.00) |
| අපහරණ කල වත්කම් විකිණීමෙන් ලැබූ ආදායම | - | 1,900,000.00 |
| වර්ෂය තුළ ආපදා ණය අයකර ගැනීම | 1,478,300.00 | 1,008,600.00 |
| අවිනිශ්චිත වගකීම් සඳහා හුවමාරු ලාභ/අලාභ ආයෝජන | 12,850,471.26 | 3,290,325.86 |
| පාරිතෝෂික සඳහා ගෙවීම | (150,492.50) | (1,063,262.50) |
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | - | - |
| අවිනිශ්චිත වගකීම් සඳහා ආයෝජනය | (79,961,196.85) | |
| අවිනිශ්චිත වගකීම් සඳහා ආයෝජනයෙන් ලද පොලිය | (5,440,412.22) | (2,425,243.80) |
| පාරිතෝෂිකය අරමුදල් ආයෝජනය සඳහා පොලී | (360,330.83) | (827,589.21) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ශුද්ධ මුදල්** | **(77,694,528.67)** | **(1,582,852.40)** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා එම**</u> | | |
| රජයේ ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල භාවිතා කරන ශුද්ධ මුදල්** | **-** | **-** |
| මුදල් සහ මුදල් සමාන අගයන්හි ශුද්ධ වැඩිවීම/අඩුවීම | (61,707,297.74) | 79,927,971.27 |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන මුදල් | 129,192,881.62 | 49,264,910.35 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන මුදල්** | **67,485,583.88** | **129,192,881.62** |

**6.6. මූල්‍ය ප්‍රකාශනයේ සටහන්**
**අනුකූලතා තක්සේරුව සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**

1.1 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති.

පොදු

අනුකූලතා තක්සේරු සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය යනු 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකාව සඳහා වන ජාතික ප්‍රතීතන අධිකාරියයි.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 44, විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, කිරිමණ්ඩල මාවත, නාරාහේන්පිට හි පිහිටා ඇත.

1.2 සකස් කිරීමේ සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල පදනම.

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 3/2013 අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS 1)

2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ දරයි.

1.2.2 අඛණ්ඩ පැවැත්ම

පාලක සභාව විසින් ශ්‍රී ලංකා අධ්‍යක්ෂ මණ්ඩලයට අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර ඔවුන් ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අදහස් නොකරයි.

1.2.3 දායක සැලසුම් නිර්වචනය

සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල

නීති රීති සහ රෙගුලාසිවලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා සේවකයින් සුදුසුකම් ලබයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් EPF සහ ETF සඳහා පිළිවෙළින් දළ වැටුපෙන් 15% සහ 3% දායක වේ. EPF සහ ETF වෙත ලැබෙන සියලුම ප්‍රේෂණ කිසිදු හිඟයකින් තොරව නියමිත වේලාවට සිදු කර ඇත.

1.3. වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

ශේෂ පත්‍ර දිනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත මුදල් වශයෙන් ලබා ගැනීමට බලාපොරොත්තු වන ඒවා වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් යනු ශේෂ පත්‍ර දින සිට වසරක කාල සීමාවකට ඔබ්බෙන් තබා ගැනීමට මණ්ඩලය අදහස් කරන ඒවා ජංගම නොවන වත්කම් වේ.

සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ පෙන්වා ඇති ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහන් වියදම් වසර ආරම්භයේදී එහි ගෙන ගිය ඉදිරි ශේෂයෙන් 50%ක් ක්‍රමක්ෂ කර ඇත.

1.3.1 දේපල යන්ත්‍ර සහ උපකරණ

දේපල යන්ත්‍ර සහ උපකරණ පිරිවැය ක්‍රමයට දක්වා ඇත. එවැනි වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ පිරිවැය කපා හැරීම සඳහා පහත සඳහන් වාර්ෂික ගාස්තු යටතේ සරල මාර්ග ක්‍රමයට ක්ෂයවීම් ලබා දී ඇත.

| **වත්කම්** | **ක්ෂය අනුපාතය** |
|---|---|
| මෝටර් රථය | 12.5% |
| ගෘහභාණ්ඩ | 20% |
| කාර්යාල උපකරණ, දුරකථන සහ ෆැක්ස් යන්ත්‍රය | 20% |
| වායු සමීකරණ සහ ශීතකරණ ඒකක | 12.5% |
| පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඩිජිටල් ප්‍රොජෙක්ටරය සහ ඡායාරූප පිටපත් යන්ත්‍ර | 25% |
| ගොඩනැගීම සහ ව්‍යුහය | 33.33% |

වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ වත්කම භාවිතයට ඇති විට වන අතර බැහැර කිරීම සඳහා හඳුනාගෙන ඇති වසර අවසානයේ නතර වේ. වසර අවසානයේ බැහැර කිරීමට හඳුනාගෙන ඇති ඕනෑම වත්කමක්, එම අයිතමයන් ඒ දක්වා ක්ෂය කරනු ලැබේ. රුපියල් 5,000 කට වැඩි වටිනාකමක් ඇති භාණ්ඩ ස්ථාවර වත්කම් ලෙස සලකනු ලබන අතර අනෙකුත් ඒවා පරිභෝජන භාණ්ඩ ලෙස සැලකේ.

1.3.2 අස්පෘශ්‍ය වත්කම්

ශ්‍රී ලංකාවේ ගුණාත්මක යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ස්වීඩන් රජයෙන් ප්‍රදානයක් ලෙස S ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල වෙබ් අඩවිය සහ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල තොරතුරු තාක්ෂණ පද්ධතිය සඳහා මෘදුකාංග සත්කාරකත්වය ලබාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය 2010 වසර අවසානයේ අවසන් කර ඇත. මෙම ප්‍රාග්ධන පිරිවැය ජංගම නොවන වත්කම් ලෙස පිළිගෙන ඇති අතර යම් යම් වෙනස් කිරීම් සිදු කරන ලද බැවින් 2013 සිට ආරම්භ වී වසර 5ක් ඇතුළත ක්‍රමක්ෂ කිරීමට තීරණය කර ඇත.

1. 4 තොග භාණ්ඩ

තොග අයිතමයන් නොමැති අතර ලිපි ද්‍රව්‍ය පමණක් පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු වටිනාකමකට අගය කර ඇත.

1.5 ලැබිය යුතු දේ

ලැබිය යුතු දෑ ඇස්තමේන්තු ගත උපලබ්ධි අගයට සටහන් කර ඇත.

1.6. වගකීම් සහ වෙන් කිරීම්

1.6.1 ජංගම වගකීම්

ජංගම වගකීම් යනු ඉල්ලුම මත හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත ගෙවීම් සඳහා ගෙවිය යුතු ඒවා වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

1.7 ආදායම සහ වියදම්

1.7.1 ආදායම් හඳුනාගැනීම

ප්‍රතීතන හා පුහුණු වැඩසටහන්වලින් ලැබෙන ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කරනු ලැබේ. 2022 දෙසැම්බර් 1 දින සිට කැලැන්ඩර් දින( ජනවාරි 1 සිට දෙසැම්බර් 31දක්වා) පදනම් කරගෙන වාර්ෂික ගාස්තු පදනම් කරගෙන ඉන්වොයිස් නිකුත් කිරීමට කටයුතු කර ඇත.

1.7.2 භාණ්ඩාගාර ප්‍රදාන

2024 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රදාන ලැබී නැත

1.7.3 වියදම් හඳුනාගැනීම

මණ්ඩලය පවත්වාගෙන යාමට සහ දේපල, කම්හල සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමට දරන ලද සියලුම වියදම් ආදායම් ප්‍රකාශය වෙත අය කර ඇත.

1.8 බදු අය කිරීම

ආදායම් බදු සඳහා වෙන් කිරීම් සිදු කර නැත.

1.9 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම හෝ ගැලපීම අවශ්‍ය වන සිදුවීම් කිසිවක් සිදු නොවිය.

1.10 සංසන්දනාත්මක සංඛ්‍යා

ප්‍රවර්තන වර්ෂය සහ සංසංදනාත්මක පෙර වර්ෂයේ සංඛ්‍යා දත්ත ඉදිරිපත් කර ඇත.

1.11 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රම භාවිතා කර සකස් කර ඇත.

දේපල කම්හල සහ උපකරණ මිලදී ගැනීම සම්බන්ධ රජයේ ප්‍රදාන ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ග කෙරේ.

1.12 විදේශ විනිමය ඉපැයීම

වසර තුළ විදේශීය ප්‍රතීතන සේවා වලින් උපයා ඇති ආදායම නිෂ්පාදන සහතිකය මගින් USD 248,315.58 වේ. ආදායමේ රුපියලේ වටිනාකම රුපියල් 72,860,809.29කි.

1.13 විදේශ විනිමය ඉපැයීම් සඳහා ගිණුම්කරණය

විදේශ ගනුදෙනු සඳහා වෙනම FEEA ගිණුමක් පවත්වාගෙන යනු ලැබේ. ප්‍රොෆෝමා ඉන්වොයිසියක් ඩොලර් හෝ යුරෝ ආකාරයෙන් FEEA වෙත ඉපැයීම් එකතු කිරීම සඳහා යවනු ලැබේ. එම තැන්පතු FEEA A/C එකතු කර මුදල් ප්‍රවාහ අවශ්‍යතාවයට අනුව ජංගම ගිණුමට මාරු කරනු ලැබේ. විදේශ විනිමය ගනුදෙනුවලින් ලැබෙන ලාභය හෝ අලාභය FEEA A/C සිට වත්මන් A/C දක්වා මුදල් ආපසු ගැනීමේදී හඳුනා ගැනේ.

1.14 පාරිතෝෂිත දීමනාව

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන් විසින් හඳුන්වා දෙන ලද සූත්‍රයට අනුව පාරිතෝෂික ප්‍රතිපාදන සිදු කර ඇති අතර එය දැන් භාවිතා කිරීම නිර්දේෂ නොවන බැවින් එක් එක් සේවකයා විසින් සම්පූර්ණ කරන ලද මුළු වසර ගණන සැලකිල්ලට ගනිමින් අපි ප්‍රතිපාදන ගණනය කළෙමු. අපේක්ෂිත අවශ්‍යතා සහ අරමුදල් ලබා ගැනීමේ හැකියාව අනුව රාජ්‍ය බැංකුවක හෝ භාණ්ඩාගාර බිල්පත්වල ස්ථාවර තැන්පතු සඳහා අරමුදල් ආයෝජනය කෙරේ. පාරිතෝෂිත දීමනා ලැබීමට හිමිකම් ඇති සියලුම සේවකයින් ආයෝජනයෙන් සම්පූර්ණයෙන්ම ආවරණය වේ.

.1.15 ආදායම ගැලපීම- නෙදර්ලන්ඩ් පාරිභෝගික- Control Union

2023 වර්ෂයේ වාර්ෂික ගාස්තු ගණනය කිරීමේදී තක්සේරුගත සේවාදායකයන් ගණන දෙවරක් ගණනය වීමක් සිදුවී ඇත. ඒ අනුව කොරියාවේ සේවාදායකයන් 2406 ක් සහ ශ්‍රී ලංකාවේ සේවාදායකයන් 1588 ලෙස මුළු සේවාදායකයන් 2994 ක් වැඩිපුර ගණනය වී ඇත.එබැවින් වාර්ෂික ගාස්තුවේ ඩොලර් 59 910 ක ගැලීමක් සිදුකිරීමට සිදුවී ඇති අතර මෙම ගැලපීම සඳහා පාලක සභාවේ අනුමැතියද ලැබී ඇත.

අනුකූලතා තක්සේරුව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය
ගිණුම් සඳහා සටහන්

